# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
# කුලියාපිටිය.
# 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයට 2026 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීමට අදාළව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. භාණ්ඩ හා සේවා කාණ්ඩ 43 ක් යටතේ ලියාපදිංචිය සිදු කරනු ලබන අතර www.wyb.ac.lk වෙබ් අඩවිය මඟින් ද මෙම විස්තර ලබා ගත හැකි ය.

එක් කාණ්ඩයකට වඩා වැඩි කාණ්ඩ සංඛ්‍යාවක් සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා අයදුම්පත් වෙන වෙන ම ඉදිරිපත් කළ යුතු ය. **ඒ සෑම කාණ්ඩයක් සඳහාම නැවත නොගෙවනු ලබන රු. 2,000.00 බැගින් වන කාණ්ඩ සංඛ්‍යාවට සමාන වටිනාකම මුදලින් " ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය" නමින් ලංකා බැංකුව කුලියාපිටිය ශාඛාවේ අංක 0001473507 දරණ ගිණුමට ගෙවීම් සිදු කර එම රිසිට්පත අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කළ යුතු ය. තැන්පතු සඳහා චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන** අතර ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතු ය.

2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දී ඔවුන් 2025 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයෙන් නිකුත් කළ මිළ කැඳවුම් හා ඇණවුම් සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය ඇගයීමට ලක් කරනු ලැබේ. මිළ කැඳවීම් සඳහා ප්‍රතිචාර නොදක්වන ලද හා ඇණවුම් සඳහා භාණ්ඩ ලබා නොදෙන ලද සැපයුම්කරුවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මඟින් ලබා දෙන තීරණ අනුව ලියාපදිංචිය සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. භාණ්ඩ හා සේවා සඳහා මිළ කැඳවීම සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබුව ද තරඟකාරී මිළක් ලබා ගැනීමට අවශ්‍ය වූ විට හා ප්‍රමාණවත් සැපයුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විට වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද මිළ ගණන් ලබා ගැනීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු ය.

2026 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් අවම වශයෙන් දින 30 ක කාලයක් සඳහා ණය පහසුකම් මත භාණ්ඩ සැපයුම් කිරීමට එකඟ විය යුතු ය.

අයදුම්පත්‍රය සමඟ ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකය , VAT සඳහා ලියාපදිංචි සහතිකය, ජාතික හැඳුනුම්පත/පත් හි පිටපත් සහ කාණ්ඩ අංක 2 හි සඳහන් අයිතම සඳහා ලබා ගන්නා ලද නිෂ්පාදන අවසරයට අදාල ලිපි (manufacture authorization letters) අමුණා එවිය යුතු ය. කොන්ත්‍රාත් කාර්යයන් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් **CIDA** සහතිකයේ පිටපතක් ද අමුණා එවිය යුතු ය. අදාළ නොවන ලිපි ලේඛණ අයදුම්පත සමග ඇමිණීම නොකළ යුතු ය.

භාණ්ඩ හා සේවාවන්ට අදාළ කාණ්ඩ / අනු කාණ්ඩ හා ආදර්ශ ආකෘති පත්‍රය පහතින් දක්වා ඇත. ඒ අනුව සකස් කළ අයදුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර ලිපි කවරයක බහා **"2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** ලෙස වම් පස ඉහළ කෙලවරේ සඳහන් කර **නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ සැපයුම්, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය** යන ලිපිනයට **2025 නොවැම්බර් 14 වන** දින ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සැපයීම් අංශයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරී ඇමතීමෙන් ලබාගත හැකි ය. (දු අ. 037-2283617)

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,
කුලියාපිටිය.
2025 / 10 / 13

**භාණ්ඩ ප්‍රසම්පාදනය.**

**කාණ්ඩ අංක 01**

**කාර්යාලීය ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ**

**1.1** මුද්‍රණ කඩදාසි, මුද්‍රණ ද්‍රව්‍ය, යතුරුලියන කඩදාසි, රෝනියෝ කඩදාසි, කාබන් කඩදාසි, ලිපිකවර, ෆයිල් කවර, සී.ආර්.පොත්, තීන්ත, පෑඩ් තීන්ත, ඇල්පෙනිති, ඇමුණුම් කටු, ස්ටේප්ලර්, ස්ටේප්ලර් කටු, ලිපිබරු ,බෝල්පොයින්ට් පෑන්, පැන්සල්, රටහුනු, රබර් සීල්, මැගීබෝඩ් පෑන් යනාදිය.

**1.2** ඡායා පිටපත් කොළ සහ පරිගණක ලිපි ද්‍රව්‍ය

**1.3** පොත් සහ සඟරා

**කාණ්ඩ අංක 02**

**පරිගණක මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් කාට්රිජ්, රිබන් සඳහා තීන්ත ආදිය.**

{නිෂ්පාදන අවසරය සඳහා ලබාගත් ලිපි ඉදිරිපත් කළ යුතු වේ. (manufacture authorization letters)}

**කාණ්ඩ අංක 03**

**කාර්යාලයීය ලී බඩු**

**3.1** කාර්යාලයීය ලී බඩු (දැව)

**3.2** කාර්යාලයීය ලී බඩු (වානේ )

**3.3** කාර්යාලයීය ලී බඩු (ෆයිබර් ග්ලාස්)

**3.4** පොලිමර් සහ ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ

**3.5** MDF ගෘහ භාණ්ඩ

**කාණ්ඩ අංක 04**

**කාර්යාලයීය උපකරණ**

**4.1** ගණක යන්ත්‍ර, ඉලෙක්ට්‍රොනික් සහ සාමාන්‍ය යතුරු ලියනයන්, පණිවිඩ හුවමාරු උපකරණ, රෝනියෝ යන්ත්‍ර, Fax Machine, ආදිය.

**4.2** පරිගණක, පරිගණක මෘදුකාංග හා දෘඩාංග

**4.3** ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා අමතර කොටස්

**4.4** ඉලෙක්ට්‍රොනික උපකරණ හා අමතර කොටස්

**4.5** ආරක්ෂක කැමරා පද්ධති

**4.6** ජාලකරණ උපාංග

**කාණ්ඩ අංක 05**

**විදුලි උපකරණ සහ උපාංග**

**5.1** අධි ශීතකරණ, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර

5.2 විදුලි ජනන යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර

5.3 විදුලිපංකා, විදුලි උදුන්, Vacuum Cleaners, Floor Polishers, Hot Cupboards, Water Dispenser, විදුලි කේතල්, ජල පෙරණ

5.4 රූපවාහිණී යන්ත්‍ර, Video Recorder, Voice Recorder

**කාණ්ඩ අංක 06**

**විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා උපකරණ**

6.1 විද්‍යාගාර උපකරණ හා අන්වීක්ෂ

6.2 විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා වීදුරු බඩු

6.3 කෘෂි රසායන ද්‍රව්‍ය

6.4 කාබනික පොහොර / රසායන පොහොර

6.5 තවාන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා පැළ

6.6 රසායනාගාරයේ භාවිතය සඳහා අවශ්‍ය උපකරණ (පිපෙට්ටු ප්ලාස්ටික් නළ වැනි දේ)

6.7 වෛද්‍ය උපකරණ හා ආශ්‍රිත උපකරණ

6.8 මිනිස් ආකෘති

6.9 ඉංජිනේරු විද්‍යාගාර සඳහා අවශ්‍ය උපකරණ හා ආශිත උපකරණ

**කාණ්ඩ අංක 07**

**ආහාරයට සුදුසු රසායනික අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්**

7.1 කිරි නිෂ්පාදන ආශ්‍රිත අමුද්‍රව්‍යයන්

7.2 එන්සයිම

7.3 කැල්සියම් ක්ලෝරයිඩ්

7.4 අනුමත රසකාරක හා වර්ණක

**කාණ්ඩ අංක 08**

**සත්ත්ව ජෛව තාක්ෂණික (Animal Biotechnology) ක්‍රම වේදයන්ට අදාළ පර්යේෂණ සිදුකිරීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය.**

8.1 taq පොලිරේස් එන්සයිම

8.2 DNTP (නියුක්ලියෝටයිඩ් මිශ්‍රණය)

8.3 100 base pair ladder

8.4 Bovine Serum Albumin (BSA)

**කාණ්ඩ අංක 09**

**සත්ත්ව ගොවිපල සඳහා වෛද්‍ය සැපයුම්කරුවන් සහ සත්ත්ව පාලන උපකරණ**

9.1 බෙහෙත් වර්ග (සත්ත්ව)

9.2 සැරහුම් ද්‍රව්‍ය

9.3 සත්ත්ව පෝෂණ ද්‍රව්‍යයන්

9.4 කිරි දෙවීමේ උපකරණ ඇතුලු අනිකුත් උපකරණ

9.5 සත්ත්ව පර්යේෂණ සඳහා අවශ්‍ය උපකරණ (සත්ත්ව කොටු සෑදීමට, සතුන්ට ජලය, ආහාර ලබා දෙන උපකරණ)

**කාණ්ඩ අංක 10**

**මෝටර් වාහන අමතර කොටස් සැපයුම්කරුවන්**

10.1 මෝටර් වාහන අමතර කොටස්

10.2 ටයර්, ටියුබ් සහ වාහන බැටරි

10.3 මෝටර් වාහන අමතර කොටස් අධ්‍යයන කටයුතු සඳහා

**කාණ්ඩ අංක 11**

**ගොඩනැගිලි ද්‍රව්‍ය සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයුම්කරුවන්**

11.1 තීන්ත, පොලිෂ්, වැක්ස්, වාර්නිෂ්, තිනර් සහ ටර්පන්ටයින්ට්

11.2 වානේ, ජී අයි තහඩු සහ පයිප්ප, යකඩ ඇණ, බෝල්ට් ඇණ, වතුර ටැංකි, උදළු, ගල්කටු, වීල්බැරෝ, අලවංගු ආදිය

11.3 P.V.C. පයිප්ප සහ සවිකිරීම්

11.4 පිඟන්, මැටි භාණ්ඩ, මුළු තැන්ගෙයි උපකරණ, සනීපාරක්ෂක උපකරණ සහ නාන කාමර කට්ටල

11.5 කොසු, බුරුසු සහ ඉදල්

11.6 රබර් සහ කොහු මෙට්ට

11.7 බල්බ,වයර්,මීටර්ස්,කේබල්ස්,ස්විච්,ප්ලග් ටොප්,හෝල්ඩර් සහ අනෙකුත් විදුලි උපාංග.

11.8 ගඩොල්, වැලි, සක්කගල්, ගල් සහ හුණු, සිමෙන්ති, උළු, වීදුරු ආදිය.

11.9 දැව සහ ඉරන ලද ලී

**කාණ්ඩ අංක 12**

**ක්‍රීඩා භාණ්ඩ සැපයුම්කරුවන්**

12. 1 ක්‍රීඩා භාණ්ඩ

12. 2 ක්‍රීඩා උපකරණ

**කාණ්ඩ අංක 13**

**ක්‍රීඩා ඇඳුම් සැපයුම්කරුවන්**

13. 1 ක්‍රීඩා ඇඳුම්

**කාණ්ඩ අංක 14**

**ඖෂධ වර්ග සැපයුම්කරුවන්**

**කාණ්ඩ අංක 15**

**රෙදි පිළි /තිර රෙදි /පාවහන් /වැහි කබා සැපයුම්කරුවන්**

15.1 නිල ඇඳුම් රෙදි

15.2 ජනෙල් රෙදි

15.3 පාවහන් (සාමාන්‍ය)

15.4 ආරක්ෂක පාවහන්

15.5 වැහි කබා ආරක්ෂක ඇඳුම් කට්ටල් ආදිය

**කාණ්ඩ අංක 16**

**16.1** ආරක්ෂක උපකරණ

**16.2** ගිනි නිවීමේ උපකරණ

**කාණ්ඩ අංක 17**

**17.1** පදක්කම් ( ලෝකඩ හා රන් ආලේපිත ) සෑදීම

**17.2** උපාධි සහතික බහාලන මංජුසා

**17.3** උපාධි ලෝගු සැපයීම

**17.4** උපාධි මාලා

## සේවා ප්‍රසම්පාදනය.

**කාණ්ඩ අංක 18**

**කාර්යාලයීය උපකරණ අලුත්වැඩියාව**

**18.1** සාමාන්‍ය හා විදුලියෙන් ක්‍රියාකරන යතුරු ලියන ඇතුළු කාර්යාල උපකරණ සහ කැල්කියුලේටර් අලුත්වැඩියා කිරීම.

**18.2** පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, අලුත්වැඩියා කිරීම.

**18.3** ශීතකරණ, අධි ශීතකරණ, වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව

**18.4** ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ අලුත්වැඩියාව

**18.5** සන්නිවේදන උපකරණ අලුත්වැඩියාව ( ෆැක්ස් යන්ත්‍ර )

**18.6** වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව

**කාණ්ඩ අංක 19**

**මුද්‍රණ කටයුතු**

**19.1** මුද්‍රණ කටයුතු සහ පොත් බැඳීම.

**19.2** ශිෂ්‍ය හැඳුනුම්පත් මුද්‍රණය / ශිෂ්‍ය වාර්තා පොත් මුද්‍රණය

**කාණ්ඩ අංක 20**

**පුටු විවීම.**

**කාණ්ඩ අංක 21**

**පානීය ජලය සැපයීම**

21.1 ජල බවුසර් මගින් පානීය ජලය සැපයීම

**කාණ්ඩ අංක 22**

**නළ ලිං**

**22.1** නළ ලිං පොම්ප අලුත්වැඩියාව හා සේවා කිරීම්

**22.2** නළ ලිං ඉදිකිරීම

**කාණ්ඩ අංක 23**

**විදුලි ජනන යන්ත්‍ර**

**23.1** විදුලි ජනන යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම්

**කාණ්ඩ අංක 24**

**මෝටර් වාහන අලුත්වැඩියාව**

**24.1** මෝටර් වාහන අලුත්වැඩියාව හා වාහන සේවා කිරීම.

**24.2** ඔටෝ ඒසී, ඔටෝ ඉලෙක්ට්‍රිකල්,ටින්කර් කිරීම, තීන්ත ගෑම හා එන්ජින් අලුත්වැඩියා කිරීම,කුෂන් වැඩ

**කාණ්ඩ අංක 25**

**පවිත්‍ර කිරීම් හා සනීපාරක්ෂක කටයුතු.**

**25.1** කාර්යාල, දේශන ශාලා හා නිවාස ශුද්ධ පවිත්‍ර කිරීම.

**25.2** ගලි ඇදීම

**25.3** උද්‍යාන අලංකරණ,

**25.4** උපාධි ලෝගු සේදීමේ සේවාවන්

**25.5** විද්‍යාගාර කබා සේදීමේ සේවාවන්

**25.6** තිර රෙදි සේදීම

**25.7** ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර සේදීමේ සේවාව

**25.8** ව්‍යවච්ජේදනය කරන ලද මල සිරුරු කොටස්, අස්ථි කොටස් ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම

**කාණ්ඩ අංක 26**

**ගෘහ අලංකරණ**

**26.1** ගොඩනැගිලි ඇතුලත අලංකරණ කොන්ත්‍රාත්කරුවන් ( තිර රෙදි, වර්ටිකල් බ්ලයින්ඩ්ස්, විදුරු, ස්ටිකර්, උත්සව සඳහා මල් සැකසුම් ආදිය)

**කාණ්ඩ අංක 27**

**ශ්‍රම සේවා සැපයීම.**

**27.1** කම්කරු සේවා සැපයීම.

**27.2** ආරක්ෂක සේවා සැපයීම

**කාණ්ඩ අංක 28.**

**භාණ්ඩ හා මගී ප්‍රවාහනය ( වායු සමනය සහිත/ වායු සමනය රහිත )**

**28.1** කුලියාපිටිය සිට සහ මාකඳුර සිට ( කාර් වෑන් බස් ලොරි ආදිය )

ප්‍රවාහන පහසුකම් සැපයිය හැක්කේ කුලියාපිටිය පරිශ්‍රයේ සිට ද සහ මාකඳුර පරිශ්‍රයේ සිට ද යන්න පැහැදිලිව දැක්විය යුතු ය.

**කාණ්ඩ අංක 29**

**පස් හාරන තලන යන්ත්‍ර, ලොරි රථ, ටිපර් රථ ආදිය කුලියට දෙන කොන්ත්‍රාත්කරුවන්.**

**කාණ්ඩ අංක 30**

**උත්සව සඳහා තාවකාලික කුටි ( Canapees ) කුලියට සැපයීම**

**කාණ්ඩ අංක 31**

**ආහාරපාන සැපයීම**

**කාණ්ඩ අංක 32**

**පුස්තකාල පොත් හා වාර සඟරා ( ප්‍රකාශකයින් සහ දේශීය නියෝජිතයින් )**

**කාණ්ඩ අංක 33**

**ගිණි නිවීමේ උපකරණ සේවා සහ නඩත්තු කටයුතු**

**කාණ්ඩ අංක 34**

**උපාධි ප්‍රධානෝත්සව ජායාරූපකරණය, කැමරාකරණය**

## වැඩ ප්‍රසම්පාදනය.

**කාණ්ඩ අංක 35**

**පරිගණක ජාලකරණය**

**කාණ්ඩ අංක 36**

**ඇලුමිනියම් කොන්ත්‍රාත්කරුවන් ( ඇලුමිනියම් පාටිෂන්, ජිප්සම් බෝඩ් පාටිෂන්, සස්පෙන්ඩඩ් සීලින්, MDF පාටිෂන් )**

**කාණ්ඩ අංක 37**

**වානේ හා මල නොබැඳෙන වානේ නිපැයුම්කරුවන් (වැටවල්, බර වානේ ගෘහ භාණ්ඩ, අත් වැටවල්, වෙල්ඩින් වැඩ, කාප්ප )**

**කාණ්ඩ අංක 38**

**මාර්ග ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවන්**

**කාණ්ඩ අංක 39**

**ගොඩනැගිලි ඉදිකිරීම, තීන්ත ගෑම, අලුත්වැඩියා හා නඩත්තු වැඩ.**
**( CIDA සහතිකයේ පිටපතක් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ය. )**

**කාණ්ඩ අංක 40**

**වඩු කාර්මික යන්ත්‍ර , උපකරණ  කොටස් සහ  අමුද්‍රව්‍ය**

**කාණ්ඩ අංක 41**

**වෑඩහල් යන්ත්‍ර උපකරණ කොටස් සහ අමුද්‍රව්‍ය**

**කාණ්ඩ අංක 42**

**වෙල්ඩිං සහ වාත්තු උපකරණ**

**කාණ්ඩ අංක 43**

**විද්‍යුත් සහ විදුලි උපකරණ  කොටස්**

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි වීම

### ආදර්ශ අයදුම්පත්‍රය

01. සැපයුම්කරුගේ/ව්‍යාපාර ආයතනයේ නම : ............................................................

02. ව්‍යාපාර ආයතනයේ ලිපිනය :

...................................................................................................................................................

03. ඇමතුම් අංක :

- ✱ දුරකථන අංක : ..........................................................................................................
- ✱ ෆැක්ස් අංක : ..........................................................................................................
- ✱ විද්‍යුත් ලිපිනය : ..........................................................................................................

04. ව්‍යාපාරයේ හිමිකාරීත්වය

(අදාල කොටුව තුල (✔) ලකුණ යොදන්න)

| | |
|---|---|
| තනි පුද්ගල ව්‍යාපාරයක් | ☐ |
| හවුල් ව්‍යාපාරයක් | ☐ |
| සීමිත සමාගමක් | ☐ |
| රාජ්‍ය ආයතනයක් | ☐ |
| සංස්ථාවක් | ☐ |

05. අයිතිකරුගේ / අයිතිකරුවන්ගේ නම් : ........................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය සහ ගුවන් ගමන් බලපත්‍ර අංකය :

........................................................................................................................

07. නිෂ්පාදක ද, එකම අලෙවි නියෝජිත ද, එකම ආනයනකරු ද, එකම බෙදා හරින්නා ද, තොග රැස්කරන්නා ද යනාදි විස්තර :

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

08. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය : ..........................................................................

09. ලියාපදිංචි ව්‍යාපාරයේ ස්වභාවය : ..........................................................................

(සැපයුම්කරුගේ / ව්‍යාපාර ආයතනයේ ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහන් කළ යුතු ය.)

10. ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව / බැංකු හා ගිණුම් අංක :

..............................................................................................................................................

11. එකතු කළ අගය මත බදු අංකය ( VAT ) : ...............................................................................

බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය ( TIN ) : ...............................................................................

12. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන භාණ්ඩ / සැපයුම් කාණ්ඩ අංකය / අනු අංක :

(i) කාණ්ඩ අංකය

| | |
|---|---|
| | |

(ii) අනු අංක

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

(එක් එක් භාණ්ඩ කාණ්ඩය හෝ සේවා කාණ්ඩය වෙනුවෙන් ලියාපදිංචි වීමට වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතු ය.)

13. දින 30 ක අවම කාලයට ණය පහසුකම් මත සැපයීම් කිරීමට එකඟ වන්නේ ද යන වග :

..............................................................................................................................

14. වෙනත් පහසුකම්, ප්‍රවාහනය, ගබඩා පහසුකම් ආදිය : ...............................................................

15. (i) ගිණුමට මුදල් ගෙවූ දිනය : ...............................................................................

(ii) වටිනාකම : රු. ...............................................................................

( අයදුම්පත සමග මුදල් ගෙවූ රිසිට් පත අමුණා එවිය යුතුවේ )

පහත සඳහන් සහතිකවල පිටපත් මෙයට අමුණා ඇත.
අදාල කොටුව තුල (✔) ලකුණ යොදන්න.

1. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය ☐
2. VAT සඳහා ලියාපදිංචි සහතිකය ☐
3. ජාතික හැඳුනුම්පත / පත් ☐
4. CIDA සහතිකය ☐
5. නිෂ්පාදන අවසරයට අදාල ලිපි (manufacturer authorization letters) ☐

දිනය: ..........................................

..............................................................................

අයදුම්කරුගේ අත්සන
නිලමුද්‍රාව